**ප්‍රධාන ලේකම් කාර්යාලය - වයඹ පළාත**
**பிரதம செயலாளர் அலுவலகம் - வடமேல் மாகாணம்**
**Chief Secretary's Office – North Western Province**

පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල    மாகாண சபை அலுவலகத் தொகுதி, குருணாகல்    Provincial Council Office Complex, Kurunegala

**ආයතන හා පරිපාලන අංශය    தாபனமும் நிறுவாக பிரிவு    Establishment and Administration Division**

මගේ අංකය / எனது இலக்கம் / My No - NWP/CS/AD/21/07/10-01/2027    ඔබේ අංකය / உமது இலக்கம் / Your No -    දිනය / திகதி / Date - 2026.08. 28

වයඹ පළාත් ආණ්ඩුකාරවර ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,
වයඹ පළාත් සභාවේ සභා ලේකම්,
වයඹ පළාත් සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
වයඹ පළාත් සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
වයඹ පළාත් සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
වයඹ පළාත් සභාවේ සියලුම ආයතන ප්‍රධානීන් වෙත.

**වයඹ පළාත් රාජ්‍ය සේවයේ ප්‍රාථමික ශිල්පීය සේවක ගණයේ (PL-3) රියදුරු සේවයේ වාර්ෂික ස්ථාන මාරු - 2027.**

2027 වර්ෂය සඳහා වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රාථමික ශිල්පීය සේවක ගණයේ වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇති බැවින් පහත උපදෙස් පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

2. ඔබ ආයතනයේ 2026.12.31 දිනට පහත 2.1.1 හා 2.1.2 හි සඳහන් සේවා කාලයක් සම්පූර්ණ කරන ලද උක්ත සේවයේ රියදුරු මහතුන් ලවා මෙයට අමුණා ඇති ස්ථාන මාරු අයදුම් පත්‍රය (ඇමුණුම 01) සම්පූර්ණ කරවාගෙන 2026.09.30 දිනට පෙර ඔබගේ නිර්දේශය සමඟ අදාළ කඩඉම් මඟින් මා වෙත ඉදිරිපත් කළ යුතුය.

2.1.1. වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශය - අවුරුදු 03 යි
2.2.2. අනෙකුත් සියලුම පළාත් රාජ්‍ය ආයතන - අවුරුදු 05 යි

2.3 ස්ථාන මාරු අයදුම් කිරීමේදී නැවත සංශෝධන ඉල්ලීම් ඉදිරිපත් නොවන පරිදි ස්ථාන මාරු වීමට කැමති ස්ථාන 05ක් නිශ්චිතව සඳහන් කිරීමට රියදුරු මහතුන්ට උපදෙස් ලබා දෙන ලෙස දන්වා සිටින අතර, සඳහන් කර ඇති සේවා ස්ථාන පහෙන් එකකට ස්ථාන මාරු ලබා දීමට නොහැකි අවස්ථාවලදී වෙනත් සේවා ස්ථානයක් වෙත ස්ථාන මාරු කිරීමට යටත් වන බවද, රියදුරු මහතුන් දැනුවත් කළ යුතුය.

2.4 ඔබ ආයතනයේ ස්ථාන මාරු අයදුම් කරන වසර 05කට වැඩි සේවා කාලයක් සහිත රියදුරු මහතුන් පිළිබඳ විස්තර මේ සමඟ අමුණා ඇති ඇමුණුම 02 අනුවද, වසර 02කට වැඩි වසර 05කට අඩු සේවා කාලයක් සහිත රියදුරු මහතුන් පිළිබඳ විස්තර ඇමුණුම 03 අනුවද, වාර්ෂික ස්ථාන මාරු අයදුම් කිරීමට හිමිකම් ඇතත් අයදුම් නොකරන රියදුරු මහතුන් පිළිබඳ විස්තර ඇමුණුම 04 අනුවද ඉදිරිපත් කළ යුතු අතර ආයතන ප්‍රධානියා විසින් මෙම ආකෘති පත්‍ර පෞද්ගලිකව පරීක්ෂා කර බලා අත්සන් කළ යුතුය.

2.5. තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 02ක් සේවය කර ඇති රියදුරු මහතුන් වාර්ෂික ස්ථාන මාරු ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් ලබන නමුත් සේවා කාලය වසර 05ට අඩු වුවද ස්ථාන මාරු සඳහා අයදුම් කරන රියදුරු මහතුන් වේ නම් ඔවුනටද ස්ථාන මාරු සඳහා අයදුම් කිරීමට අවස්ථාව ලබා දෙන අතර අනුප්‍රාප්තික රියදුරු මහතෙකු ලබා දිය හැකි අවස්ථාවකදී පමණක් මෙම රියදුරු මහතුන්ගේ ඉල්ලීම් සලකා බලනු ලැබේ.



ප්‍රධාන ලේකම් කාර්යාලය / பிரதம செயலாளர் அலுவலகம் / Chief Secretary's Office - Tel : 037-2231769-72, Fax : 037-2222234, e-mai : csnwp@sltnet.lk, Web site : www.cs.nw.gov.lk
ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary - Tel : 037-2223777, Fax : 037-2228019, e-mail : csnwp@sltnet.lk
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන) / பிரதி பிரதம செயலாளர் (நிர்வாகம்) / Deputy Chief Secretary (Administration) - Tel : 037-2223195, e-mail : depcsnwp@sltnet.lk

2.6. ඔබ ආයතනයේ වසර 05 හෝ ඊට වඩා වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන් අතුරින් විශේෂිත රාජකාරියක් හෝ විශේෂිත ව්‍යාපෘතියක සේවය සඳහා යොදවා ඇති රියදුරු මහතුන් සිටී නම් ඔවුන් සම්බන්ධව ස්ථාන මාරු අයදුම්පත් ඇමුණුම 05 ආකෘතියට අනුව ඉදිරිපත් කරන ලෙස දන්වා සිටිමි.

2.7. වසර 5ක් සම්පූර්ණ කරන ලද නමුත් වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම් නොකරන රියදුරු මහතුන් පිළිබද විස්තර ඇමුණුම 04 අනුව ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශය සහිතව ඉදිරිපත් වූ පසු ඔවුන් ද ස්ථාන මාරුවීම් වලට යටත් වේ.

2.8. වාර්ෂික ස්ථාන මාරු අයදුම් පත්‍රය, වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය හා ස්ථාන මාරු සම්බන්ධ අනෙකුත් සියලු උපදෙස් වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලයේ නිල වෙබ් අඩවියෙන් ( www.cs.nw.gov.lk) බාගත කර ගත හැක.

03. එමෙන්ම පහත සඳහන් කරුණු පිළිබඳව අදාළ රියදුරු මහතුන් දැනුවත් කිරීම කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කරවමි.

3.1 වසර 05ට වැඩි සේවා කාලයක් එකම සේවා ස්ථානයේ සේවය කළද ස්ථාන මාරු සඳහා ඉල්ලුම් නොකළ රියදුරු මහතුන් හා ස්ථාන මාරු සඳහා ආයතන නම් නොකළ රියදුරු මහතුන් හට සේවා අවශ්‍යතාවයන් අනුව ලබා දෙන ස්ථාන මාරු සම්බන්ධව ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බලනු නොලැබේ.

3.2 රියදුරු මහතුන් සඳහා ස්ථාන මාරු ලබා දුන් පසුවත් ඇතැම් ආයතන ප්‍රධානීන් විසින් විවිධ හේතු ඉදිරිපත් කරමින් ඔවුන්ගේ ස්ථාන මාරු අවලංගු කරන ලෙස වරින් වර මා වෙත ඉල්ලීම් කරන බැවින්, එවැනි රියදුරු මහතුන් නිදහස් කිරීමට හැකිවන පරිදි සුදුසු රියදුරු මහතුන් හට අදාළ පුහුණුව ලබා දීම හෝ වෙනත් සුදුසු විකල්පයක් කල් වෙලා ඇතිව යොදා ගැනීම ඔබගේ වගකීම වේ.

3.3 වහාම ක්‍රියාත්මක වන පරිදි වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රාථමික ශිල්පීය සේවක ගණයේ (PL-3) රියදුරු සේවයේ සුහද ස්ථාන මාරුවීම් හා අනෙකුත් ස්ථාන මාරු සියල්ල නැවත දැනුම් දෙන තෙක් මෙයින් අත්හිටවනු ලබන අතර අන්තර් පළාත් ස්ථාන මාරු මෙයට බාධාවක් නොවන ලෙසට සිදු කරන ලෙස දන්වමි.

04. එකම සේවා ස්ථානයක දීර්ඝ කාලයක් සේවයේ නියුතු රියදුරු මහතුන් සම්බන්ධයෙන් සෑම වසරකම විගණන විමසුම්වලට ලක්වන බැවින්, ඔබ ආයතනයේ අවු.5කට වඩා වැඩි සේවා කාලයක් ඇති රියදුරු මහතුන් වාර්ෂික ස්ථාන මාරු යටතේ ස්ථාන මාරු කිරීමට ඔබගේ විශේෂ අවධානය යොමු කර ඒ සඳහා ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

05. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII වැනි පරිච්ඡේදයේ 257 වගන්තිය අනුව කටයුතු කළ යුතු බව අවධාරණය කරන අතර ඉහත උපදෙස් අනුගමනය කර මෙම වාර්ෂික ස්ථාන මාරුවීම් බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීමට ඔබගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

අයි.එම්.අයි. ඉලංගකෝන්,
ප්‍රධාන ලේකම්,
වයඹ පළාත.

## <u>වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රාථමික ශිල්පීය සේවක ගණයේ</u>
## <u>ස්ථාන මාරු අයදුම්පත්‍රය - 2027</u>

**අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/කාර්යාලය:-......................................................................**

**<u>"අ" කොටස</u>**

(රියදුරු මහතා විසින් සම්පූර්ණ කළ යුතුය)

1.සම්පූර්ණ නම :-

..............................................................................................................................

..............................................................................................................................

2.උපන් දිනය :- වර්ෂය ......................... මාසය ............................ දිනය ..........................

3. 2026.12.31 දිනට වයස:- අවුරුදු ............................

4.රාජකාරි ලිපිනය :-

..............................................................................................................................

..............................................................................................................................

5.ස්ථිර පදිංචි ලිපිනය :-

..............................................................................................................................

..............................................................................................................................

5.1. ස්ථිර පදිංචි ලිපිනයට ආසන්නම නගරය :- ..........................................................................

5.2. ස්ථිර පදිංචි ස්ථානයේ සිට ආසන්නම නගරයට ඇති දුර (කි.මී.):- ...........................................

5.3. දුරකථන අංකය :- පුද්ගලික:-.................................. රාජකාරි :- .........................................

6.සේවය පිළිබඳ විස්තර:- **(පත්වීම් ලිපියේ සහතික කළ පිටපතක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ)**

6.1.සේවක ගණය:-....................................................................................................

6.2.දැනට සිටින තනතුර:- ..........................................................................................

6.3.එම තනතුරට පත්වූ දිනය :- .......................................

6.4.දැනට සිටින ශ්‍රේණිය :- ..................................

6.5.එම ශ්‍රේණියෙට පත්වූ දිනය :- .....................................

6.6. මාධ්‍යය :- ....................................

7.පුද්ගලික තොරතුරු :-

7.1.විවාහක / අවිවාහක බව :- ..................................................

7.2.විවාහක නම්,

7.2.1. කලත්‍රයා රාජ්‍ය සේවකයෙක්ද ? ............................

7.2.2. රජයේ සේවකයකු නම්,

(අ) සේවය ..............................................................................

(ආ) දැනට දරණ තනතුර ...........................................................................

(ඇ) සේවා ස්ථානයේ ලිපිනය ..........................................................................

7.2.3. කලත්‍රයා ක්‍රියාන්විත සේවයේ යෙදී සිටීද ? ..........................................................

7.2.4.කලත්‍රයා හමුදා සේවයේ (යුධ/ගුවන්/නාවික) හෝ පොලිසියේ සේවයේ නියුක්ත නම් ඒ සම්බන්ධ විස්තර,

(අ) ඔහු/ඇය නියුක්ත සේවාව :-.....................................................................

(ආ) සේවා ස්ථානයේ ලිපිනය :- ...........................................................................

8.පාසල් යන දරුවන් පිළිබඳ විස්තර,

| නම | වයස | ඉගෙනුම ලබන පාසල |
|---|---|---|
| 1...................................................... | ................. | ....................................................... |
| 2...................................................... | ................. | ....................................................... |
| 3...................................................... | ................. | ....................................................... |
| 4...................................................... | ................. | ....................................................... |
| 5...................................................... | ................. | ....................................................... |

9.රියදුරු මහතා රාජ්‍ය සේවයට ඇතුලත් වූ දිනයේ සිට මේ දක්වා එක් එක් සේවා ස්ථානයේ ගත කල සේවා කාලයන් පිළිබඳ විස්තර ( කරුණාකර අනුපිළිවෙලින් සටහන් කරන්න. ඉඩ ප්‍රමාණවත් නොවේ නම් ඇමුණුමක් භාවිතා කරන්න.)

| අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය | සේවා කාලය<br>සිට දක්වා | සේවා කාලය<br>අවු/මාස/දින |
|---|---|---|
| 1...................................................... | ........................................ | .................... |
| 2...................................................... | ........................................ | .................... |
| 3...................................................... | ........................................ | .................... |
| 4...................................................... | ........................................ | .................... |
| 5...................................................... | ........................................ | .................... |

10.ඔබ කැමති සේවා ස්ථාන පහක් කැමැත්ත අනුව අනුපිළිවෙලට සඳහන් කරන්න.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | සේවා ස්ථානය |
|---|---|
| 1...................................................... | ..................................................... |
| 2...................................................... | ..................................................... |
| 3...................................................... | ..................................................... |
| 4................................................. | ............................................. |
| 5................................................. | ............................................. |

11.ඔබට මෙම ස්ථාන මාරු ඉල්ලීම සම්බන්ධව විශේෂයෙන් සඳහන් කළ යුතු දෙයක් ඇත්නම් මෙහි සඳහන් කරන්න.

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

ම'විසින් මෙහි දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

දිනය:-.........................................

.................................................
රියදුරු මහතාගේ අත්සන

"ආ" කොටස

**ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**

1 සිට 9 දක්වා සපයා ඇති තොරතුරු සත්‍ය බව ප්‍රකාශ කරමි. අනුප්‍රාප්තිකයකු සහිතව / රහිතව මෙම රියදුරු මහතා මුදා හැරිය හැකිය/නොහැකිය. ඉල්ලුම් පත්‍රය නිර්දේශ කරමි/නොකරමි.

...........................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

දිනය:- ...................................

**<u>"ඉ" කොටස</u>**

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**

ලේකම්,
................................................අමාත්‍යාංශය,
වයඹ පළාත.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

......................................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

දිනය :- ..........................................

**<u>"ඊ" කොටස</u>**

**අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය**

ප්‍රධාන ලේකම්,
වයඹ පළාත.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

......................................................................
අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන හා නිල මුද්‍රාව

දිනය:- ................................

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
වයඹ.

## වයඹ පළාත් සහා රාජ්‍ය සේවයේ ප්‍රාථමික ශිල්පීය සේවක ගණයේ වාර්ෂික ස්ථාන මාරු - 2027
## (ස්ථාන මාරු අයදුම් කරන වසර 05 ට වැඩි සේවා කාලයක් ඇති රියදුරු මහතුන්)

අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව/ආයතනය :- .............................................................................................
අනුමත රියදුරු සංඛ්‍යාව :- .............................................................................................
දැනට සිටින රියදුරු සංඛ්‍යාව :- .............................................................................................
ස්ථාන මාරු අයදුම් කරන රියදුරු සංඛ්‍යාව :- .............................................................................................
ස්ථාන මාරු නිර්දේශ කරන රියදුරු සංඛ්‍යාව :- .............................................................................................

**පහත නම් සඳහන් රියදුරු මහතුන්ගේ ස්ථාන මාරු අයැදුම්පත් නිර්දේශ කොට මේ සමඟ එවමි.**

| අංකය | රියදුරු මහතාගේ නම | මුල් පත්වීමේ දිනය | වර්තමාන ශ්‍රේණිය | වර්තමාන ශ්‍රේණියට පත් වූ දිනය | වර්තමාන කාර්යාලයට වාර්තා කළ දිනය | නිර්දේශය අනුප්‍රාප්තිකයෙකු රහිතව/සහිතව/පසුව ලබා ගැනීමේ පදනම මත |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

ඉහත තොරතුරු නිවැරදි බව සහතික කරමි. මේ අනුව මෙම කාර්යාලයේ වයඹ පළාත් සහා රාජ්‍ය සේවයේ ප්‍රාථමික ශිල්පීය සේවක ගණයේ මුළු රියදුරු මහතුන් සංඛ්‍යාව .............වන අතර, අවු: 05 ක් ඉක්මවූ ස්ථාන මාරු අයදුම්කල රියදුරු මහතුන් සංඛ්‍යාව .................... ක් බවද සහතික කරමි.

දිනය - ..........................

.......................................................

ආයතන ප්‍රධානියා/ දෙපාර්තමේන්තු ප්‍රධානියා

...........................................

...........................................

...........................................

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
වයඹ.

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රාථමික ශිල්පීය සේවක ගණයේ වාර්ෂික ස්ථාන මාරු - 2027**
**(ස්ථාන මාරු අයදුම් කරන වසර 02 ට වැඩි 05 ට අඩු සේවා කාලයක් ඇති රියදුරු මහතුන්)**

**පහත නම් සඳහන් රියදුරු මහතුන්ගේ ස්ථාන මාරු අයැදුම්පත් නිර්දේශ කොට මේ සමඟ එවමි.**

| අංකය | රියදුරු මහතාගේ නම | මුල් පත්වීමේ දිනය | වර්තමාන ශ්‍රේණිය | වර්තමාන ශ්‍රේණියට පත් වූ දිනය | වර්තමාන කාර්යාලයට වාර්තා කළ දිනය | නිර්දේශය අනුප්‍රාප්තිකයෙකු රහිතව/සහිතව/පසුව ලබා ගැනීමේ පදනම මත |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

ඉහත තොරතුරු නිවැරදි බව සහතික කරමි. මේ අනුව මෙම කාර්යාලයේ වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රාථමික ශිල්පීය සේවක ගණයේ මුළු රියදුරු මහතුන් සංඛ්‍යාව ..........වන අතර, අවු: 02 ට වැඩි 05 ට අඩු ස්ථාන මාරු අයදුම් කල රියදුරු මහතුන් සංඛ්‍යාව .................... ක් බවද සහතික කරමි.

දිනය - ............................

........................................................
ආයතන ප්‍රධානියා/ දෙපාර්තමේන්තු ප්‍රධානියා

ඇමුණුම 04

..........................................

..........................................

..........................................

ප්‍රධාන ලේකම්,

ප්‍රධාන ලේකම් කාර්යාලය,

වයඹ.

## වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රාථමික ශිල්පීය සේවක ගණයේ වාර්ෂික ස්ථාන මාරු - 2027
## (සුදුසුකම් සපුරා ඇති එහෙත් වාර්ෂික ස්ථාන මාරු අයදුම් නොකරන රියදුරු මහතුන්ගේ ලැයිස්තුව)

**පහත නම් සඳහන් රියදුරු මහතුන්ගේ ස්ථාන මාරු නිර්දේශ කොට මේ සමඟ එවමි.**

| අංකය | රියදුරු මහතාගේ නම | මුල් පත්වීමේ දිනය | වර්තමාන ශ්‍රේණිය | වර්තමාන ශ්‍රේණියට පත් වූ දිනය | වර්තමාන කාර්යාලයට වාර්තා කළ දිනය | වාර්ෂික ස්ථාන මාරු අයැදුම් නොකිරීමට හේතුව |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

දිනය - ..........................

..........................................................

ආයතන ප්‍රධානියා/ දෙපාර්තමේන්තු ප්‍රධානියා

.........................................

.........................................

.........................................

ප්‍රධාන ලේකම්,

ප්‍රධාන ලේකම් කාර්යාලය,

වයඹ.

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රාථමික ශිල්පීය සේවක ගණයේ වාර්ෂික ස්ථාන මාරු - 2027**
**(විශේෂ රාජකාරි / විශේෂ පුහුණුවක් ලබා විශේෂ ව්‍යාපෘතියක නියුතු රියදුරු මහතුන්)**

පහත නම් සඳහන් රියදුරු මහතුන්ගේ ස්ථාන මාරු අයැදුම්පත් නිර්දේශ කොට මේ සමඟ එවමි.

| අංකය | රියදුරු මහතාගේ නම | ලබා ඇති විශේෂිත පුහුණුව | වර්තමාන ශ්‍රේණිය | වර්තමාන ශ්‍රේණියට පත් වූ දිනය | වර්තමාන කාර්යාලයට වාර්තා කළ දිනය | නිර්දේශය අනුප්‍රාප්තිකයෙකු රහිතව /සහිතව |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

දිනය - ..........................

.......................................................
ආයතන ප්‍රධානියා/ දෙපාර්තමේන්තු ප්‍රධානියා

..........................................

..........................................

..........................................

ප්‍රධාන ලේකම්,

ප්‍රධාන ලේකම් කාර්යාලය,

වයඹ.

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රාථමික ශිල්පීය සේවක ගණයේ වාර්ෂික ස්ථාන මාරු - 2027**
**(එක් දෙපාර්තමේන්තුවක වසර 05කට වැඩි කාලයක් සේවය කර ඇති එම දෙපාර්තමේන්තුව යටතේම ඇති ප්‍රාදේශීය කාර්යාලයකට අභ්‍යන්තර ස්ථාන මාරු ලබා වසර 05කට අඩු කාලයක් ඇති රියදුරු මහතුන්)**

**පහත නම් සඳහන් රියදුරු මහතුන්ගේ ස්ථාන මාරු අයැදුම්පත් නිර්දේශ කොට මේ සමඟ එවමි.**

| අංකය | රියදුරු මහතාගේ නම | මුල් පත්වීම් දිනය | වර්තමාන ශ්‍රේණිය | වර්තමාන ශ්‍රේණියට පත් වූ දිනය | අදාල දෙපාර්තමේන්තුවට තුළ කාලය | වර්තමාන කාර්යාලයට වාර්තා කළ දිනය | නිර්දේශය අනුප්‍රාප්තිකයෙකු රහිතව /සහිතව/පසුව ලබා ගැනීමේ පදනම මත) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

දිනය - ..........................

..........................................................

ආයතන ප්‍රධානියා/ දෙපාර්තමේන්තු ප්‍රධානියා